


# ගී මල් වැස්ස

**11 වන දා**
**බැරි රෝඩ් ප්‍රජා ශාලාවේ දී**
**වසින වගයි**

ගී මල් වැස්ස නමින් සංගීත ප්‍රසංගයක් මෙල්බර්න් හි වෙසෙන කුඩා ගායිකාවක් ඉදිරිපත් කරන්නට සැරසෙයි. ඇය ඇන්ඩ්‍රියා රණසිංහ යි සෙන්ට් ඇලෝසියස් විදුහලේ 7 වන වසරේ ඉගෙනුම ලබන ඇන්ඩ්‍රියා ගීත ගායනයට මෙන්ම වාදනයටද එකසේ දස්කම් දක්වන දියණියක්.
සංගීත පරපුරකින් පැවත එන ඇයගේ පියා අසේල රණසිංහ යි. ඔහු ශ්‍රී ලංකාවේ සියැක්



සහ රේන්බෝ යන ජනප්‍රිය සංගීත කණ්ඩායම් වල බේස් ගිටාර් වාදකයා ලෙස කටයුතු කළා ඇන්ඩ්‍රියාගේ මව හිමාලි රණසිංහ පාසල් කාලයේ සිටම ගීත ගායනයට ගීත ගායනයට දස්කම් දක්වන ශිල්පිණියක්. ඒ වගේම ඇගේ කුඩා මලනුවන් වන කෙවින් අපූරුවට භාෂා තුනෙන්ම ගීත ගායනා කිරීමට දස්කම් දක්වනවා.

අක්කා සහ මල්ලී එක්ව ගී මල් වැස්ස ඉදිරිපත් කරන වේලාවේ මෙල්බන්හි සිටින දක්ෂ ගායන ශිල්පීන් වන ශ්‍රීපාලි එදිරිසිංහ වෛද්‍ය ගීහාන් සමරසිංහ තිලකා රූපසිංහ යන ශිල්පිනියන් මෙන්ම ඔස්ට්‍රේයානු ජාතික හෙලන් එයිට්කින්ස් ගීත ගායනා කරනවා මෙහි විශේෂත්වය වන්නේ ඔස්ට්‍රේලියානු ශිල්පිණිය සිංහල ගීත දෙකක් ගායනා කිරීමයි.

ප්‍රසංගයට සංගීතය සපයනු ලබන්නේ ඉතා ජනප්‍රිය සංගීත කණ්ඩායමක් වන සුනන්ද ප්‍රමුඛ සී සෙවන්ත් සංගීත කණ්ඩායමයි. ඇන්ඩ්‍රියා කුඩා ගයිකාව මුල් වරට අප දුටුවේ දයා සිල්වා මහතාගේ ඒක පුද්ගල සංගීත ප්‍රසංගයේදී ය. එහිදී ඇය ගීත කීපයක් ගායනා කර රසික සිත් දිනාගන්නට සමත් වුණා. ඒ ආරම්භ වූ ගමන දෙමාපියන්ගේත් අනුග්‍රහය මත මෙල්බර්න් වෙසෙන බොහෝ දෙනාගේ උදව් උපකාරයෙන් ප්‍රසංගයක් දක්වා ආ හැටි දකින විට අපට ඇතිවන්නේ සතුටකි.
මෙහි විශේෂත්වයක් වන්නේ අපේ පුංචි ගායිකාව බටහිර ගීත කීපයක් සමගින් සිංහල ගීත ගයන අතර පියවරුන්ගේ දිනය වෙනුවෙන් ඇය විසින් රචනා කොට සංගීතවත් කරන ලද ගීතයක්ද ඉදිරිපත් කිරීමයි. ඇගේ ගිටාර් වාදනයක්ද රස විඳින්නට අපට හැකිවෙයි. අවුරුදු 5 ක් වයස කුඩා කෙවින් බටහිර හින්දි සහ සිංහල ඉංග්‍රීසි ගීත ගයන්නට සූදානම්ව සිටියි.

මේ ප්‍රසංගය නරඹන්නට එන්නැයි අපි සියල්ලන්ටම ආරාධනා කරමු. සහභාගි වන සැමට ආහාර ද පහසු මිලට ලබා ගත හැකි ය. ස්ථානය Barry Road Community Centre Barry Road Lalor 11th September At 7pm'

ශ්‍රීනාත් මද්දුමගේ





EXCLUSIVE IN MELBOURNE
RED CARPET HAIRSTYLIST
Your Dream WEDDING
Photographic-runaway
Special occasions.
FREE MAKEUP
Professional Makeup Artist
and Hairstylist for Your
Wedding
SHIRANI by Appointment:
0432 992 071



